# කෘෂිකර්ම අමාත්‍යාංශය
# ලංකා පොස්පේට් ලිමිටඩ්

# පුරප්පාඩු

## අයදුම්පත් කැඳවීම

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ සම්පූර්ණයෙන් රජය සතු සමාගමක් වන ලංකා පොස්පේට් ලිමිටඩ් හි දැනට පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීමට හැකි දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විශිෂ්ට චරිතයකින් හෙබි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### "කළමනාකරණ සහකාර - තාක්ෂණික" සේවා ගණයේ (MA 2-1) - III ශ්‍රේණියේ පොත් තබන්නා තනතුර.

**පුරප්පාඩු සංඛ්‍යාව : 01**

**සුදුසුකම් :**

- අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍යපෙළ විභාගයේදී සිංහල, ගණිතය සහ ඉංග්‍රීසි විෂයන් ඇතුළුව විෂයන් හතර (04) කට සම්මාන සහිතව එකවර විෂයන් හය (06) කින් සමත්ව තිබීම සහ අධ්‍යයන පොදු සහතිකපත්‍ර උසස්පෙළ විභාගයේදී ගණකාධිකරණය විෂයයට සම්මාන සහිතව වාණිජ විෂය ධාරාවෙන් අවම වශයෙන් විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වීම.

සහ

- ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) විභාගයේ අවසන් අධියර සමත්වීම/ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා විභාගයෙන් අධියර 3 ක් සමත්වීම/ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත්වීම.
- ගණකාධිකරණ/ වාණිජවේදී/ කළමනාකරණ උපාධිය ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

**සේවා පළපුරුද්ද :**

- ඉහත සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පරිගණක ආශ්‍රිත ගිණුම්කරණ පැකේජයන්හි වසර 02 කට නොඅඩු සේවා පළපුරුද්ද.
- ගිණුම් විගණනය සම්බන්ධව විගණන ආයතනික සේවා පළපුරුද්ද/ පරිගණක භාවිතය (MS Office Package) පිළිබඳව පිළිගතහැකි ආයතනයක මාස 06 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

**මාසික වැටුප් පරිමාණය :**

MA 2-1 2016 - රු. (30,310-10X300-07X350-04X495-20X660-50,940/-)

**වැටුප් පියවර** : රු. 30,310/-

**සේවා ස්ථානය** : ලංකා පොස්පේට් ලිමිටඩ් - එප්පාවල ව්‍යාපෘතිය

**වැටුපට අමතරව ගෙවනු ලබන දීමනා**

- රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාව
- මාසික නිෂ්පාදන දිරි දීමනා
- පැමිණීමේ දීමනා
- ප්‍රවාහන දීමනා
- ආහාර දීමනා

**වෙනත් ප්‍රතිලාභ**

- වාර්ෂික ප්‍රසාද දීමනා
- ඉතිරි කරගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්
- සේ.අ.අ./ සේ.භා.අ. දායකත්වය
- වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් බිල්පත් ප්‍රතිපූර්ණය
- පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය

**බඳවා ගැනීමේ ක්‍රමය :**

අයදුම්පත් කැඳවීමෙන් පසුව තෝරා ගත් අයදුම්කරුවන්ගෙන් තනතුරට අදාළ වන පරිදි වූ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**බඳවා ගැනීමේ වයස :**

වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර අයදුම්පත් සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව උප්පැන්න සහතිකයේ පිටපතක් අදාළ අධ්‍යාපනික සහ වෙනත් අදාළ වෘත්තියවේදී සුදුසුකම් පිළිබඳ සහතික වල පිටපත්ද, සහිතව අදාළ ක්ෂේත්‍රයේ අයදුම්කරුගේ කුසලතා දැනුම පිළිබඳ තක්සේරු කළ හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනය සමග නිසි පරිදි සම්පූර්ණ කර ලේඛනගත (ලියාපදිංචි) තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් 2021 ජූලි මස 26 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබීමට සැලැස්විය යුතුය.

රජයේ සේවයේ/ රාජ්‍ය සංස්ථා වල/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ දැනටමත් නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානින් මගින් ඉදිරිපත්කළ යුතු වන අතර, මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන පරිදි ඉදිරිපත් කරනු ලබන සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවන ලිපිකවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම්කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

සේවා පළපුරුද්ද හා ලබා ඇති සුදුසුකම් පදනම් කරගනිමින් තෝරා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**සභාපති,**
**ලංකා පොස්පේට් ලිමිටඩ්,**
**අංක 73 1/1, නව කැලණි පාලම පාර, කොළඹ 14.**
**දුරකථන අංකය : 011-2459907/8**
**ඊ මේල් : info@lpl.lk**

**2021-07-04 දින.**